මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PRE/2024/51 2024.08.27

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම

2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 38 (2) උප වගන්තිය අනුව ඉදිරි ඡන්ද විමසීම්වල දී පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවකට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහායකයකු කැටුව යා හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

02. එහෙත් එම කැටුව යන සහායකයා වයස 18 සම්පූර්ණ වූවකු විය යුතු අතර, එම ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයකු නොවිය යුතු ය. එමෙන්ම එම ඡන්ද විමසීමේ දී යම් අපේක්ෂකයෙකුගේ බලයලත් නියෝජිතයකු ප්‍රාදේශීය නියෝජිතයකු හෝ ඡන්ද පොළ නියෝජිතයකු වශයෙන් කටයුතු නොකරන්නකු විය යුතු ය. ඊට අමතරව කිසියම් අශක්නුතාවකට පත් නොවූ අයකු ද විය යුතු ය.

03. ඉහත සඳහන් පරිදි සහායකයකු කැටුව යාම සඳහා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ පස්වන උපලේඛනය මගින් හඳුන්වා දී ඇති යෝග්‍යතා සහතිකයක් අදාළ ඡන්ද පොළෙහි නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

04. මෙම යෝග්‍යතා සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් හෝ www.elections.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. දෘෂ්‍යාබාධිත හෝ වෙනත් යම් ශාරීරික අශක්නුතාවට පත් පුද්ගලයා ඉහත පරිදි ඉල්ලුම් පත්‍රයක් ලබාගෙන සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කර සහතිකය ලබාගත යුතු අතර, ඉන් අනතුරුව එම සහතිකය රජයේ වෛද්‍ය නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතු ය. වෛද්‍ය නිලධාරී විසින් ඡන්ද හිමියා පරීක්ෂා කර එම ආකෘතියෙහි ඡන්ද හිමියාගේ යෝග්‍යතාව සටහන් කර සහතික කරනු ලැබේ.

05. අශක්නුතාවට පත් ඡන්ද හිමියා විසින් තමාගේ නිල ඡන්ද දැන්වීම්පත, ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේ දී පිළිගනු ලබන වෙනත් යම් හැඳුනුම්පතක් සහ මෙම යෝග්‍යතා සහතිකය රැගෙන සහායකයා ද කැටුව ඡන්ද පොළ වෙත යා යුතු ය. ඡන්ද පොළ කාර්ය මණ්ඩලය විසින් ඡන්ද හිමියාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඡන්ද පොළේ සාමාන්‍ය ක්‍රියාපරිපාටිය අනුගමනය කර ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලබන අතර, එම ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයා සමග ඡන්ද දායකයා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත යොමු කරනු ලැබේ. සහායකයා ද තමාගේ ජාතික හැඳුනුම්පත හෝ ඡන්ද පොළේ දී පිළිගනු ලබන යම් හැඳුනුම්පතක් රැගෙන යාම අත්‍යාවශ්‍යය.

06. ඡන්ද පොළේ දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ඡන්ද හිමියාගේ යෝග්‍යතා සහතිකය ලබා ගනු ලබන අතර, කැටුව ආ පුද්ගලයාගෙන් යෝග්‍යතා සහතිකයේ III වන කොටසට අදාළ ප්‍රකාශය සටහන් කරවා ගනු ලැබේ. අනතුරුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ද සමග ඡන්ද හිමියා සහ සහායකයා ඡන්ද කුටිය වෙත කැඳවාගෙන ගොස් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා කාර්ය මණ්ඩල සාමාජිකයා ඉදිරියේ ඡන්ද පත්‍රිකාව සලකුණු කරවා ඡන්ද පෙට්ටියට බහාලීමට සලස්වනු ලැබේ.

07. ඉහත සඳහන් යෝග්‍යතා සහතිකයක් නොමැතිව ඡන්ද පොළ වෙත සහායකයකු කැටුව යා නොහැකි බව අවධාරණය කරනු ලැබේ. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව අදාළ යෝග්‍යතා සහතිකය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත රඳවා ගනු ඇත.

08. කෙසේ වුවද සහායකයකු කැටුව ඒමට නොහැකි වන අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට අවශ්‍ය වන්නේ නම් මීට පෙර ඡන්ද විමසීම්වල දී සිදු කළ ආකාරයටම තවත් නිලධාරියෙක් ඉදිරියේ දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ලවා ස්වකීය ඡන්ද පත්‍රිකාව සලකුණු කරවා ගැනීමට අවකාශ ඇති බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission electionsl

ජනාධිපතිවරණය - 2024

1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත
[38(2) (ඇ) වගන්ති] ප්‍රකාරව යම් අශක්නුතාවකට පත් තැනැත්තකුට නිකුත්
කරන ලද ඡන්දය ප්‍රකාශ කිරීමේ යෝග්‍යතා සහතිකය
(පස්වන උපලේඛනය)

1 වන කොටස

ඉල්ලුම්කරුගේ/ ඡන්දදායකයාගේ ප්‍රකාශය

01. සම්පූර්ණ නම :..............................................................................................................

02. ලිපිනය:........................................................................................................................

03. රක්ෂාව :...........................................................................................................

04. උපන් දිනය :.................................................

හැඳුනුම්පතේ/රියදුරු බලපත්‍රයේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය : ................................................................ ..................................................................................................................................පදිංචි අශක්නුතාවකට පත්.........................................................................................................................වන මම............................................. දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්දදායකයකු වන බව ද, ඉහත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව ද ප්‍රකාශ කරන අතර, එළඹෙන .....................................................................සඳහා (මැතිවරණයේ නම) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් වූ තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට මා හට හිමිකම ලබාදීමේ සුදුසුකම් සහතිකයක් නිකුත් කරන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

දිනය:............................................

ඡන්දදායකයාගේ නම :...................................................................................................

ඡන්දදායකයාගේ අත්සන :..................................................

ග්‍රාම නිලධරයාගේ සහතිකය

.................................................................................................ගේ (ඉල්ලුම්කරුගේ/ඡන්දදායකයාගේ නම) ඉල්ලුම් පත්‍රයට අදාළ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් පහත දැක්වෙන තොරතුරු මා විසින් පවත්වාගෙන යන වාර්තාවලට අනුකූලව නිවැරදි බවත් සහතික කරමි.

නම :...........................................................................................................................

ඡන්ද හිමි ලැයිස්තුවේ අංකය: ....................

පළාත : ..........................................................................

දිස්ත්‍රික්කය : ....................................................................

ඡන්ද කොට්ඨාසය : ...................................................

වෙනත් අදාළ තොරතුරු : ...............................................................................................

දිනය :............................................ ග්‍රාම නිලධරියාගේ අත්සන : ..............................

ග්‍රාම නිලධරියාගේ නම : ..............................................................

කොට්ඨාශය : ....................................................

මුද්‍රාව : ....................................................

II වන කොටස

රජයේ වෛද්‍ය නිලධරයාගේ සහතිකය

එළඹෙන ....................................මැතිවරණය සඳහා (මැතිවරණයේ නම) අශක්නුතාවකට පත් වූ තැනැත්තෙකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලබාගැනීමට ඉල්ලුම් කර ඇති ...................................................................................යන අය මා විසින් පෞද්ගලිකව ම පරීක්ෂා කර ඇති බවත්, නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි අශක්නුතාවකට පත් තැනැත්තකු ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට ඒ: ..................................................................................යන අය (ඡන්දදායකයාගේ/ ඉල්ලුම්කරුගේ නම) හිමිකම් ලබන/නොලබන බවත් මෙයින් සහතික කරමි.

දිනය : ......................................
රජයේ වෛද්‍ය නිලධරයාගේ නම :.....................................................................................................

රජයේ වෛද්‍ය නිලධරයාගේ අත්සන : ....................................

මුද්‍රාව : ...........................................................

.............................................................................................................................................................

(A) III වන කොටස (අයදුම්පත් අංකය..............)

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් මෙම කොටස සම්පූර්ණ කරවා ගත යුතුය.**

ඡන්ද හිමියා කැටුව ආ තැනැත්තාගේ නම: .....................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය: ......................................................

පදිංචි ලිපිනය: ......................................................................................................................................

අශක්නුතාවකට ලක්ව ඇති ඉහත 1 වෙනි කොටසේ නම් සඳහන් ඡන්ද හිමියා වෙනුවෙන් ඡන්දය සලකුණු කිරීමට පැමිණි මම මෙම ජනාධිපතිවරණ මැතිවරණයේ අපේක්ෂකයෙකු /බලයලත් නියෝජිතයෙකු /ඡන්දපොළ නියෝජිතයෙකු හෝ ඡන්ද පොළ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු නොවන බවත් අශක්නුතාවකට ලක් වූ අයකු නොවන බවත් ප්‍රකාශ කර සිටිමි.

ඡන්දහිමියා කැටුව ආ තැනැත්තාගේ අත්සන: ......................................................

ඡන්දහිමියා කැටුව ආ තැනැත්තාගේ නම: ..............................................................................

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන: ....................................................

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නම: ....................................................

ඡන්ද පොළ: ......................................................

(මෙහි එක් පිටපතක් ඡන්ද විමසීම් දිනට පෙර දින අදාළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත භාර දිය යුතුය.)